සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** **07 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** **தரம் 07**
**Third Term Test 2017** **Grade 07**

**බුද්ධ ධර්මය - I කොටස**

**පැය දෙකයි**
***Two hours***

- **එක් එක් ප්‍රශ්නයට අදාල වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. තුණුරුවන් සරණ යන අය උපාසකයන් ලෙස හැඳින්වේ. බුදුන් හා දහම්සරණ ගිය දේවාචික උපාසකයන් ලෙස හැඳින්වෙන්නේ,
   1. බරණැස් සිටුතුමා හා සුජාතා සිටු දියනිය.
   2. තපස්සු භල්ලුක ය
   3. උපක හා සංජීවක ය.

2. ගිලනුන්ට උපස්ථාන කිරීම බුදුරජාණන් වහන්සේගේ විශේෂ ලක්ෂණයකි. ගිලානෝපස්ථානය පිළිබඳ සඳහන්වන "යො භික්ඛවේ මංඋපට්ඨහෙය්‍ය සො ගිලානං උපට්ඨහෙය්‍ය" යනපාඨය ඇතුළත් වන්නේ,
   1. මහාවග්ග පාලියේ ය.
   2. චුල්ලවග්ග පාලියේ ය.
   3. පරිවාර පාලියේ ය.

3. බුද්ධ දේශනා සියල්ල ත්‍රිපිටකයට අයත්වේ. ත්‍රිපිටකය යනු සූත්‍ර විනය අභිධර්මය වේ. ධම්මපදය ඇතුලත් වන්නේ සූත්‍ර පිටකයෙහි කිනම් නිකායටද?
   1. දීඝනිකායට
   2. මජ්ඣිමනිකායට
   3. ඛුද්දකනිකායට

4. සිඟාලෝවාද සූත්‍රයෙහි යුතුකම් 61 පිළිබඳ උගන්වනු ලබයි. එහි යුතුකම් වශයෙන් "යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම" කවරෙකුගේ යුතු කමක් ද?
   1. දෙමාපියන්ගෙන් ඉටුවිය යුතු යුතු කමකි.
   2. ගුරුවරුන්ගෙන් ඉටුවියයුතු යුතුකමකි
   3. මිතුරන්ගෙන් ඉටුවියයුතු යුතුකමකි

5. විශාඛා සිටුදියණිය යහපත් යුග දිවියක් ගතකල කාන්තාවකි. ඇය යුගදිවියට එලබෙන දිනයේ ඇයගේ පියා වන ධනංජය සිටුතුමා යුගදිවිය සාර්ථක කර ගැනීම සඳහා දෙන ලද උපදෙස් ප්‍රමාණය වන්නේ,

1. දහයකි 2. අටකි 3. හයකි

6. බුදුරජාණන් වහන්සේ රෝග හටගන්නා ක්‍රම අටක් පිළිබඳ ගිරිමානන්ද සූත්‍රයෙහි හඳුන්වා ඇත. එහි සඳහන් වන "සන්නිපාතිකා ආබාධා" යනු,

1. වාතය කිපීමෙන් හටගන්නා ආබාධ
2. අනුන්ගෙන් බෝවීමෙන් හටගන්නා ආබාධ
3. වැරදි පුරුදු නිසා හටගන්නා ආබාධ

7. බුදුවරයෙකු ලොව පහළවන්නේ චතුරාර්ය සත්‍යය දේශනා කිරීමටයි. බුදුරජාණන් වහන්සේ ඉසිපතනයේදී චතුරාර්ය සත්‍යය ඇතුළත් කර දේශනා කළ ප්‍රථම ධර්ම දේශනාව වන්නේ,

1. සිඟාලෝවාද සූත්‍රය
2. දම්සක්පැවතුම් සූත්‍රය
3. රතනසූත්‍රය

8. ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව රැගෙන සංඝමිත්තා තෙරණින් වහන්සේ ලංකාවට පැමිණීමෙන් ජන සමාජයේ ජාතික, ආගමික, සංස්කෘතික ආදි ක්ෂේත්‍ර ගණනාවක ප්‍රබෝධයක් ඇතිවිය. සංඝමිත්තා තෙරණිය ලංකාවට පැමිණෙන්නේ,

1. උඳුවප් පොහොය දිනය.
2. වෙසක් පොහොය දිනය.
3. පොසොන් පොහොය දිනය.

9. මහලු බමුණකු රූමත් තරුණියක ආවාහ කර ගෙන හිමියා ගෙදරින් බැහැර කරවා සොර සැමියෙකු සමග විසූ ආකාරය පිළිබඳ සඳහන් ජාතකය වන්නේ,

1. අපණ්ණක ජාතකය
2. වෙස්සන්තර ජාතකය
3. සත්තුභත්ත ජාතකය

10. දන් සිල් භාවනා .... යන කවිය අඩංගු ග්‍රන්ථය වන්නේ,

1. කාවශේඛරයේය.
2. බුදුගුණ අලංකාරයේය.
3. ලෝවැඩ සඟරාවේය.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රකාශයන් හරි නම් (✔) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

11. බුදුහිමියන් තමන්ට ගුරුවරයෙකු නැති නිසා ධර්මය ගුරුතන්හි තබාගත්තේ පස්වන සතියේදීය. (..........)
12. කරණීයමෙත්ත සූත්‍රයෙහි ඇතුළත්ව ඇත්තේ නිවන් පතන මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග 10 කි. (..........)
13. උඩුගං බලා යාමට මඟපෙන්වන දහමක් වන බුදු දහම පටිසෝත ගාමීය. (..........)
14. සීල, සමාධි, පඥා යනු ත්‍රිවිධ ශික්ෂාවේ. (..........)
15. අසීමිත ලෙස අධික ලෙස සැප විඳීම අත්තකිලමථානු යෝගයයි. (..........)

- **අංක 16 සිට 20 දක්වා ඇති වගන්ති වල හිස් තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා වගන්ති සම්පූර්ණ කරන්න.**

16. පස්වග මහණුන් රහත්වූයේ ............................................ ය ඇසීමෙනි.
17. මියගිය ඥාතීන්ට පිං අනුමෝදම් කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින්............................................ දේශනාව සිදුකරන ලදී.
18. සිරිත් මල්දම රචනා කළේ ............................................ ය.
19. කාව්‍යශේඛරය රචනා කළේ............................................ ය.
20. ජේතවනාරාමය සකස් කර පූජා කරන ලද්දේ ............................................ ය.

(අනේ පිඬු සිටුතුමා, ඇම්.ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා, තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝ, අනන්ත ලක්ඛනසූත්‍ර, තිරෝකුඩ්ඩසූත්‍ර)

( ලකුණු 2 x 20 = 40 )

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** **07 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** **தரம் 07**
**Third Term Test 2017** **Grade 07**

**බුද්ධ ධර්මය - II කොටස**

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු ලියන්න.

(01) I ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස බුදුහිමියන්ට ආරාධනා කළේ කවුද?

II බුදු සසුනේ පළමු ආරාම පූජාව කුමක්ද? එය පූජා කරන ලද්දේ කව්රුන් විසින්ද?

III විශාඛා විසින් සකස් කරන ලද ආරාමය කුමක්ද?

IV ඉවසීම අප මහා බෝසතාණන් වහන්සේ ප්‍රගුණ කළ අයුරු ප්‍රකාශ වන ජාතක කථාව කුමක්ද?

V අග්‍රශෂ්‍ය දානය යනු කුමක්ද?

VI පංචමහා ගංගාවලින් 3ක් නම් කරන්න?

VII බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට බෝධීන් වහන්සේ වටා ඉදිකරන ගෘහය හඳුන්වන්නේ කිනම් නමකින්ද?

VIII තුලා ධාරික පුද්ගලයා යනු කවුද?

IX මිහිඳු මහා රහතන්වහන්සේ සමඟ පැමිණි පිරිස කවුරුන්ද?

X අප කතා කරන වචන වල ඇතුළත් විය යුතු ප්‍රධාන අංග 03 ක් පිළිබඳව සඳහන් වන සූත්‍රය කුමක්ද?

(ලකුණු 2 x 10 = 20)

(02) I ගුරුවරයාගෙන් යුතුකම් කීයක් ඉටුවේද? ( ලකුණු 2 )

II ශිෂ්‍යයාගෙන් ඉටුවිය යුතුකම් ලියන්න. ( ලකුණු 3 )

III යුතුකම් ඉටුකිරීමෙන් ලැබෙන යහපත කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )

(03) I ගිලනුන් යනු රෝගිවූ පුද්ගලයන්ය. බුදු හිමියන් රෝගී වූ භික්ෂුවකට පිහිට වූ අවස්ථාවක් නම් කරන්න?

( ලකුණු 2 )

II උපස්ථායකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් නම් කරන්න? ( ලකුණු 3 )

III පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබට ගිලනුන් ට පිහිට විය හැකි ආකාර කෙටියෙන් විස්තර කරන්න.

( ලකුණු 5 )

(04) I බෞද්ධයාගේ නිත්‍ය සීලය හඳුන්වන වෙනත් නමක් ලියන්න. ( ලකුණු 2 )

II නිත්‍ය සීලය පිළිවෙලින් ලියන්න. ( ලකුණු 3 )

III සිල් රැකීමෙන් සමාජයට සිදුවන යහපත කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )

(05) I අනේකංගදස්සි වීම යනු කුමක්ද? ( ලකුණු 2 )

II නියාම ධර්ම පහ නම් කරන්න. ( ලකුණු 3 )

III නියාම ධර්ම දෙකක් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )

(06) I අනුගමනය නොකල යුතු අන්තගාමී පිළිවෙත් දෙක නම් කරන්න. ( ලකුණු 2 )

II චතුරාර්ය සත්‍යය නම් කරන්න. ( ලකුණු 3 )

III අරි අටහි මග ත්‍රිශික්ෂාවලට බෙදා දක්වන්න. ( ලකුණු 5 )

(07) I සබ්බේ තසන්ති දණ්ඩස්ස

සබ්බේසං ජීවිතං පියං .......... යන ගාථාව සම්පූර්ණ කරන්න. ( ලකුණු 2 )

II මෙම ගාථාවේ තේරුම ලියන්න. ( ලකුණු 3 )

III අධිපති ධර්ම නම් කර කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )